# 10 නිදහස් අධ්‍යාපනයේ පියා

'නිදහස් අධ්‍යාපනයේ පියා' යන විරුදාවලියෙන් පිදුම් ලැබූ සී. ඩබ්ලිව්. ඩබ්ලිව්. කන්නන්ගර මහතාගේ ජීවන චරිතය ඇසුරෙන් මේ පාඩම සකස් කර ඇත.



1884 ඔක්තෝබර්මස 13 වැනිදා අම්බලන්ගොඩ රන්දොඹේ දී මෙලොව එළිය දුටු ක්‍රිස්ටෝපර් විලියම් විජේකෝන් කන්නන්ගර දරුවාගේ පියා වූයේ බලපිටිය උසාවියේ නියෝජ්‍ය පිස්කල්වරයා ලෙස කටයුතු කළ ජෝන් ඩැනියෙල් විජේකෝන් ය. මව එමිල් විජේකෝන් වූවා ය. කන්නන්ගර දරුවා මුලින් ම අධ්‍යාපනය ලබා ගැනීමට ඇතුළත් වූයේ අම්බලන්ගොඩ වෙස්ලියන් විදුහලට ය. ඒ වසරෙහි දී ම

ඔහුගේ මව මිය ගිය අතර, පියාගේ රැකියාව ද අහිමි විය. එහෙත් සියලු කරදර මැද අප්‍රතිහත ධෛර්යයෙන් යුතුව ඉගෙනීම දිගට ම කරගෙන ගියේ ය.

ගාල්ලේ රිච්මන්ඩ් විද්‍යාලයට ඇතුළත් වීමේ තරග විභාගයට පෙනී සිට ඉන් පළමු වෙනියා ලෙස සමත් වුණු කන්නන්ගර ශිෂ්‍යයා එම විද්‍යාලයේ සෑම ත්‍යාග ප්‍රදානෝත්සවයක දී ම ඒ ඒ වර්ෂයේ ශූරතා ත්‍යාගය ද ඇතුළුව ත්‍යාග ගණනාවක් දිනා ගැනීමෙන් අති විශිෂ්ට දක්ෂතාවක් පෙන්නුම් කළේ ය.

රිච්මන්ඩ් ක්‍රිකට් කණ්ඩායමේ නායකයා ලෙස ද කටයුතු කළ ඔහු දක්ෂ පාපන්දු ක්‍රීඩකයකු විය.

පාසල් අධ්‍යාපනයෙන් පසු ව විදුහල්පතිතුමාගේ ඉල්ලීම පරිදි රිච්මන්ඩ් විදුහලේම ගුරුවරයෙකු ලෙස කටයුතු කළ කන්නන්ගර මහතා පසු ව නීති විද්‍යාලයට ඇතුළු වී නීතිය හදාරා නීතිඥයෙකු බවට පත් විය.

කන්නන්ගර මහතා 1923 ජුනි මස 18 වැනිදා ව්‍යවස්ථාදායක මන්ත්‍රණ සභාවට තේරී පත් වූ අතර 1931 පැවති මැතිවරණයෙන් නැවත ජයග්‍රහණය කර ශ්‍රී ලංකාවේ අධ්‍යාපන ඇමතිවරයා බවට පත් විය. රටේ සියලුම දරුවන්ට පළමු වන ශ්‍රේණියේ සිට විශ්වවිද්‍යාලය දක්වා නොමිලයේ අධ්‍යාපනය ලබාදීම සඳහා 'නිදහස් අධ්‍යාපනය' නම් පණත එතුමා පර්ලිමේන්තුවට ඉදිරිපත් කර දහසක් බාධක මැද සභා සම්මත කර ගත්තේ ය. 1943 දී ක්‍රියාත්මක වූ නිදහස් අධ්‍යාපනයෙන් ඉහළට යාමට අවස්ථාව තිබුණේ ධනවත් අයට පමණකි. අධ්‍යාපනයට එතුමාගෙන් සිදුවූ සේවාව නිසා ම 1943දී ලංකා විශ්වවිද්‍යාලයේ උපාධි ප්‍රදානෝත්සවයේ දී එතුමාට සම්මාන ආචාර්ය උපාධිය පිරිනමන ලදී.

මධ්‍ය විද්‍යාල පිහිටුවීම, දුප්පත් දක්ෂ සිසුන්ට ශිෂ්‍යත්ව ක්‍රමයක් ඇති කිරීම, මවුබසින් අධ්‍යාපනය ලබා දීමට පියවර ගැනීම ආදිය එතුමාගෙන් අධ්‍යාපනයට සිදු වූ සේවාවන් ය. ලංකාවේ අධ්‍යාපනයට එතුමාගෙන් සිදු වූ සේවය නිසා ම එතුමා ''නිදහස් අධ්‍යාපනයේ පියා'' යන විරුදාවලියෙන් පිදුම් ලැබුවේ ය. අධ්‍යාපන ක්ෂේත්‍රයට සුවිශාල මග පෙන්වීමක් සිදු කළ එතුමා 1969 සැප්තැම්බර් මස 23 වැනි දා මෙලොව හැර ගියේ ය.

## ක්‍රියාකාරකම්

1. පාඩම ශබ්ද නගා කියවන්න.
2. පාඩම ඇසුරින් පහත ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.
    i. සී. ඩබ්ලිව්. ඩබ්ලිව්. කන්නන්ගර මහතාගේ දෙමවුපියෝ කවරහු ද?
    ii. එතුමා මුලින් ම අධ්‍යාපනය ලැබුවේ කුමන පාසලෙන් ද?
    iii. සී. ඩබ්ලිව්. ඩබ්ලිව්. කන්නන්ගර මහතා "නිදහස් අධ්‍යාපන පනත" ඉදිරිපත් කළේ කුමක් සඳහා ද?
    iv. එතුමා සම්මාන ආචාර්ය උපාධියෙන් පිදුම් ලැබුවේ කුමන කරුණක් සඳහා ද?

### භාෂා භාවිතය

1. පහත සඳහන් ඡේදයේ අඩංගු ඉරි ඇඳි පද පූර්ව ක්‍රියා පද ලෙස හඳුනාගන්න.

    මම උදයෙන් ම <u>නැගිට</u> <u>කා බී</u> <u>හැඳපැළඳ</u> පාසලට ගියෙමි. මා පාසලට යන විට මගේ මිතුරු සරෝජ් ද <u>පැමිණ</u> සිටියේ ය. අපි අත්වැල් <u>බැඳගෙන</u> ක්‍රීඩා පිටිය දෙසට ගමන් කළෙමු.

2. වරහන් තුළින් සුදුසු පදය තෝරා ගෙන පහත දී ඇති ප්‍රස්තාව පිරුළු සම්පූර්ණ කරන්න.

    (කළ කළ දේ, එකදා වැහි, පුදුම රටේ, ගඟට, කෑම වගෙයි)

    i. උගුරට හොරා බෙහෙත් ......................................
    ii. අරුම ...................................... පණමට පොල් හැටයි.
    iii. ...................................... පල පල දේ.
    iv. හැමදා නියං ...................................... වළාවේ.
    v. ...................................... ඉනි කැපුවා වගෙයි.

3. සෑම පදයක ම අක්ෂර වින්‍යාසය නිවැරැදි ව යෙදී ඇති පද පේළිය තෝරා ඔබේ අභ්‍යාස පොතේ ලියන්න.

i. විමර්ෂණය, පිළිරුව, ප්‍රස්ථාරය.

ii. කුෂ්ටය, මධ්‍යසාරය, ප්‍රශංසාව.

iii. කාර්යාලය, ශිෂ්‍යාචාරය, විශ්වාසය.

iv. ඓක්‍යය, ප්‍රතිඵලය, සම්ප්‍රදාය.

## පැවරුම්

1. සී. ඩබ්ලිව්. ඩබ්ලිව්. කන්නන්ගර මැතිතුමා ඉටු කළ ජාතික සේවාවන් කීපයක් ලියා දක්වන්න.

2. ඔබ දන්නා ජාතික වීරයෙකු පිළිබඳ රචනයක් ලියන්න.